**පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව**

---

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ඔක්තෝබර් 21 දින එළඹි අංක 2790 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.02 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, වර්තමානයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 07හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ, ගිණුම් කටයුතු භාවය හා මූල්‍යමය හා තාක්ෂණිකව ශක්තිමත් වූ පළාත් පාලන ආයතන මගින් දියුණු පළාත් පාලන යටිතල පහසුකම් හා කාර්යක්ෂම සේවා සැපයීමක් ඉටුකර ගැනීමයි. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,940 කට සමාන එජඩො මිලියන 68.8 ක් වූ අතර එයින් රු.මිලියන 7,670 කට සමාන එජඩො මිලියන 59 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට ප්‍රථමයෙන් එකඟ වී තිබුණි. කෙසේ වුවද, විදේශ ගැනුම් හිමිකම්වලට එරෙහිව එජඩො ප්‍රතිප්‍රමාණය වීම හේතුවෙන්, එකඟ වන ලද මුදල රු.මිලියන 7,892 කට සමාන එජඩො මිලියන 52.04ක් ලෙස තීරණය වී තිබුණි. 2012 ජූලි 01 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2015 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි

ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(එ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඔ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුල හා 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | 2016 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුල | | උපයෝජනය කළ අරමුදල් 2016 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 52.04 | 7,892.00 | 19.73 | 2,899.71 | 17.50 | 2,571.95 | 45.02 | 6,149.07 |
| ශ්‍රීලංර | 9.77 | 1,270.10 | 2.89 | 424.33 | 2.86 | 420.46 | 8.11 | 1,102.92 |
| **එකතුව** | **61.81** | **9,162.10** | **22.62** | **3,324.04** | **20.36** | **2,992.41** | **53.13** | **7,251.99** |

**3.2 භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතියේ මූලික තාක්ෂණික සහායක වාර්තාවේ පොදු කොන්දේසි අනුව, පරිපාලන ගොඩනැඟිලි ඉදිකිරීමේ සහ යටිතල පහසුකම් සහ අනෙකුත් ප්‍රජා පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණු වෙනුවෙන් තෝරාගනු ලැබූ පළාත් පාලන ආයතන වෙත එකකට රු.මිලියන 50 බැගින් වෙන් කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වනවිට පළාත් පාලන ආයතන විසින් සිදුකර තිබූ සිවිල් වැඩවල ප්‍රගතිය පහත දැක්වේ.

| කාර්යයයේ ස්වභාවය | සම්බන්ධ වී සිටින පළාත් පාලන ආයතන සංඛ්‍යාව | සංවර්ධන කාර්යයන් | |
| --- | --- | --- | --- |
| | | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුල නිම කිරීමට අපේක්ෂිත | 2016 දෙසැම්බර් 31 වනවිට නිම කර තිබූ |
| | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව |
| පරිපාලන ගොඩනැඟිලි ඉදිකිරීම | 39 | 40 | 37 |
| යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | 21 | 21 | 19 |
| ප්‍රජා පහසුකම් වැඩිදියුණු කිරීම | 80 | 89 | 87 |
| ජල සම්පාදන ව්‍යාපෘති | 18 | 25 | 16 |
| වෙනත් | 3 | 3 | 3 |

කොන්ත්‍රාත් පිරිනැමීමේ ප්‍රමාදයන් හේතුවෙන් වයඹ පළාතේ වනාතවිල්ලුව, මහව සහ ගල්නෑව ප්‍රාදේශීය සභා, මධ්‍යම පළාතේ උඩපළාත ප්‍රාදේශීය සභාව සහ ඌව පළාතේ හඳුන්ගමුව, මහියංගණය සහ මීගහකිවුල ප්‍රාදේශීය සභා විසින් ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන ව්‍යාපෘතිවල සියයට 50 සිට සියයට 85 පරාසයක මන්දගාමී ප්‍රගතියක් වාර්තා කර තිබුණු බව නිරීක්ෂණය විය. එමනිසා, ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසන් වනවිට එම කාර්යයන් නිම කිරීමේ හැකියාව විගණනයේදී නිශ්චය කළ නොහැක.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොදු ලක්ෂණයක් වශයෙන්, අළුතින් ඉදිකරන ලද ගොඩනැගිලිවල සහ අනෙකුත් ආකෘතිවල තත්ත්වයේ අසමත්වීම් විගණකයින් විසින් සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණවලදී අනාවරණය විය. ප්‍රතිඵලයක් වශයෙන්, දකුණු පළාතේ නෙළුව ප්‍රාදේශීය සභාවේ සතිපොළ පරිශ්‍රයේ රු. මිලියන 41.44 ක පිරිවැයකට ඉදිකරන ලද රැඳවුම් බිත්තියේ කොටසක් කඩා වැටී තිබුණි. තවද, දකුණු පළාතේ කරන්දෙනිය, තිස්සමහාරාම සහ කටුවන ප්‍රාදේශීය සභාවල රු. මිලියන 80.39 ක මුළු පිරිවැයකට ඉදිකරන ලද මායිම් තාප්පවල සහ මධ්‍යම පළාතේ මහනුවර කඩවත් සතරෙහි තැන්නේකුඹුර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවල ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැඟිලිවල මායිම් තාප්පවල පිපිරීම් දක්නට ලැබුණි. පළාත් පාලන අධිකාරීන් කිහිපයක් විසින් ක්‍රියාත්මක කළ සිවිල් ඉදිකිරීම් කාර්යයන් තත්ත්ව ප්‍රමිතීන් සමඟ අනුකූල වීම ශක්තිමත් කිරීමට විධිමත් ක්‍රමයකට අධීක්ෂණය කර නොතිබුණි.

(ආ) තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ රු. මිලියන 5.83 ක පිරිවැයකට ඉදිකරන ලද වර්ග අඩි 3,015 කින් සමන්විත මාළු වෙළඳපොළ ගොඩනැඟිල්ල ගිවිසුම්ගත වීමකින් තොරව වාණිජ අරමුණු වෙනුවෙන් ව්‍යාපාරිකයෙකුට භාවිතා කිරීමට අවසර ලබාදී තිබුණි.එමනිසා, ව්‍යාපෘතිය විසින් කරන ලද ආයෝජනයෙන් අපේක්ෂිත ප්‍රතිඵල අදාළ ප්‍රාදේශීය සභාවට උත්පාදනය කරගත නොහැකි වී තිබුණි.

(ඉ) විදුලි සම්බන්ධතාවය නොමැතිවීම හේතුවෙන්, රු.මිලියන 32.09 ක පිරිවැයකට අගලවත්ත ප්‍රාදේශීය සභාවේ සවිකර ඇති ප්ලාස්ටික් කුඩු කරන යන්ත්‍රය සහ පොලිතින් කම්පැක්ටරය 2017 ජුනි 30 වනවිටත් භාවිතයට ගතහැකි තත්ත්වයේ නොතිබුණි. තවද, ජල සැපයුම නොමැතිවීම හේතුවෙන්, රු. මිලියන 5.31 ක පිරිවැයකට උතුරු මැද පළාතේ

මහඉලුප්පල්ලම සහ තිරිප්පනේ ඉදිකරන ලද කොම්පෝස්ට් නිෂ්පාදන මධ්‍යස්ථානය 2017 ජුනි 30 වන විටත් භාවිතා නොකර පැවතුණි.

(ඊ) සැලසුම් නිර්මාණයේ දෝෂ සහ පස් පරීක්ෂා කිරීමකින් තොරව ඉදිකිරීම් කාර්යයන් ආරම්භ කිරීම හේතුවෙන්, කාර්යාල, සෞඛ්‍ය සහ මාතෘ ආරක්ෂණය, ශ්‍රවණාගාරය සහ පුස්තකාලය යන පහසුකම් වලින් සමන්විත මධ්‍යම පළාතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව සඳහා බහුකාර්ය ගොඩනැඟිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ රු. මිලියන 45.94 ක් වූ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 60.18 දක්වා වැඩි වී තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් සිදු කරන ලද පැහැදිළි කිරීම අනුව, අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී ඇත්තේ ගොඩනැඟිල්ලේ අත්තිවාරම ශක්තිමත් කිරීම සඳහාය.

(උ) ඌව පළාතේ මීගහකිවුල රු. මිලියන 13.76 ක පිරිවැයකට අළුතෙන් ඉදිකරන ලද බස් නැවතුම්පොළ සඳහා ප්‍රවේශ මාර්ග සහ විදුලි සැපයුම ආදි පහසුකම් සපයා නොතිබූ බව නිරීක්ෂණය විය. එමනිසා, ප්‍රවේශ පහසුකම් සැපයීමට ඉඩම අත්පත් කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රාදේශීය සභාව විසින් රු. මිලියන 9.15 ක අමතර පිරිවැයක් වැයකර තිබුණි. ප්‍රතිඵලයක් වශයෙන්, 2017 මාර්තු 31 වන විටත් බස් නැවතුම්පළ පොදු ජනතාවගේ භාවිතය සඳහා විවෘත කර නොතිබුණි.

(ඌ) ජලයේ තත්ත්වය පිරිහීම හේතුවෙන් බස්නාහිර පළාතේ පාලින්ද නුවර ප්‍රාදේශීය සභාවේ ජල සම්පාදන ක්‍රමය නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. තවද, දියපාර අසල ජීවත්ව සිටින ජනතාව එය අපවිත්‍ර කිරීම නවතා ජල මූලාශ්‍රය දූෂණය වීම ආරක්ෂා කර ගැනීමට ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. පවුල් 360 ක් සඳහා බාහිර මූලාශ්‍ර වෙතින් පානීය ජලය සැපයීමට ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 28.62 ක මුදලක් වැයකර තිබුණි. තවද, අප ජලය මිශ්‍ර වීමේ බැක්ටීරියා බලපෑම හේතුවෙන්, රු. මිලියන 28.62 ක විශාල පිරිවැයක ධාරිතාවයක් ඇති බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ දික්ලන්ද ජල සම්පාදන ක්‍රමයේ ජලයේ තත්ත්වය පානීය ජල අවශ්‍යතාවය සඳහා සුදුසු නොවීය.

(එ) විදුලියේ වෝල්ටීයතාවය අඩුවීම හේතුවෙන්, කළුතර දිස්ත්‍රික්කයේ රෙමුණ ජල සම්පාදන ක්‍රමයද ඵලදායි ලෙස ක්‍රියාත්මක නොවීය. තවද, මනු කියවීම, පද්ධති නඩත්තුව, ප්‍රතිලාභීන්ගෙන් එකතු කරනු ලබන මුදල් සම්බන්ධව පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම ආදිය සඳහා මදුරාවල ප්‍රාදේශීය සභාව විසින් ජල සම්පාදන ක්‍රමය සැලසුම් අදියරේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අදාළ ප්‍රාදේශීය සභාවේ නිළධාරීන් 03 දෙනෙකු ජලය බෙදාහැරීම සහ නඩත්තු කාර්යයන් වෙනුවෙන් අනුයුක්ත කර ඇති බව බස්නාහිර පළාත් පාලන කොමසාරිස් සහ පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ පැහැදිළි කර තිබුණද එම කාර්යයන් සඳහා කිසිදු නිළධාරියෙකු පත් කර නොතිබූ බව ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඒ) ව්‍යාපෘතිය විසින් බස්නාහිර පළාතේ අළුතින් ඉදිකරන ලද පුස්තකාල ගොඩනැඟිලි සඳහා ලී බඩු සැපයීමේ කොන්ත්‍රාත්තුව ඒ පිළිබඳ කරන ලද තාක්ෂණික යෝජනාවන් මත පදනම්ව රු. මිලියන 22.64 ක පිරිවැයකට පිරිනමා තිබුණි. තවද, රු. මිලියන 2.51 ක් වටිනා පොත් රාක්ක 158 ක් පමණක් 2016 දෙසැම්බර් 31 වන විට සපයා තිබුණි. සැබෑ අවශ්‍යතාවයන් තක්සේරු කිරීමෙන් තොරව ප්‍රමාණ පත්‍රවල සඳහන් පිරිවිතරයන් සකසා ඇති බවත් සපයා ඇති පොත් රාක්ක අපේක්ෂිත අරමුණු සඳහා යෝග්‍ය නොවන බවත් පසු අදියරවලදී අනාවරණය විය.

**3.4 නිශ්ක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යයන් සම්පූර්ණ කර පළාත් පාලන අධිකාරීන් වෙත බාරදී ඇති සිවිල් ඉදිකිරීම් දීර්ඝ කාලයක් තිස්සේ නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. බස්නාහිර පළාතේ දිවුලපිටිය සහ දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා, මධ්‍යම පළාතේ රත්තොට, නාඋල සහ විල්ගමුව ප්‍රාදේශීය සභා සහ උතුරු මැද පළාතේ ගල්ගමුව, තිරප්පනේ සහ ඉපලෝගම ප්‍රාදේශීය සභාවල රු.මිලියන 402.24 ක මුළු පිරිවැයකට ඉදිකරන ලද පරිපාලන ගොඩනැඟිලි පොදු ජනතාවගේ භාවිතය සඳහා අවසර දීමෙන් තොරව 2017 ජුනි 30 වන විට වර්ෂ 1 ½ ක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ඉහත සඳහන් කාරණයට අමතරව, ව්‍යාපෘතිය විසින් ඉදිකරන ලද ගොඩනැඟිලිවල සමහර කොටස් අදාළ පළාත් පාලන අධිකාරීන් විසින් අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිතා නොකරන බව ස්ථානීය පරීක්ෂණේදී අනාවරණය විය. එමනිසා, බස්නාහිර පළාතේ බියගම සහ මදුරාවල ප්‍රාදේශීය සභාවල, සබරගමුව පළාතේ අයගම ප්‍රාදේශීය සභාවේ සහ මධ්‍යම පළාතේ මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවල බහුකාර්ය ගොඩනැඟිලිවල ශ්‍රවණාගාර 2017 ජුනි 30 වනවිටත් නිශ්කාර්යව පැවතුණි. තවද, දකුණු පළාතේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ, සබරගමුව පළාතේ අයගම ප්‍රාදේශීය සභාවේ, ඌව පළාතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ සහ උතුරු මැද පළාතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ සති පොළවල වෙළඳ කුටි 2017 ජුනි 30 වනවිටත් නිශ්කාර්යව පැවතුණි.

(ඇ) පොදු ජනතාවගේ ඉල්ලුම අඩුවීමෙන් රු. මිලියන 16.51 ක පිරිවැයකට විල්ගමුව ප්‍රාදේශීය සභාවේ ඉදිකරන ලද ආදාහනාගාරය ඌන උපයෝජිතව පැවතුණි. සුසාන භූමි, හෝ ආදාහනාගාර ලෙස භාවිතා කිරීමට ප්‍රදේශයේ ඉඩම් පැවතීම, අඩු ජන ඝනත්වය සහ ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ මූල්‍යාමය නොහැකියාව වැනි කරුණු ආදාහනාගාරය ඉදිකිරීමට තීරණය ගන්නා අවධියේදී සළකා නොතිබූ බව නිරීක්ෂණය විය.

**3.5 මත භේදයට තුඩුදෙන කරුණු**

-------------------------------

මධ්‍යම පළාතේ යටවත්ත ප්‍රාදේශීය සභාව සඳහා රු.මිලියන 43.91ක පිරිවැයකට බහුකාර්ය ගොඩනැඟිල්ලක් ඉදිකර තිබුණද, ඒ පිළිබඳ අදාළ ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීමක් කර නොතිබූ බවත් ප්‍රාදේශීය සභාවේ ප්‍රමුඛ අවශ්‍යතා සළකා නොමැති බවටත් එයින් සාක්ෂි සපයයි.